Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

| | | |
|---|---|---|
| ශ්‍රේණිය - 10 | විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | සතිය - මාර්තු 03 සතිය |

(01) ළමා ඇඳුම් මැසීම පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක වූ දිළිනි, මෝස්තර නිර්මාණ ශිල්පියකු වන දිලාන් සමග සමානව ප්‍රාග්ධනය යොදා "දිලූ ටෙක්ස්" නමින් ළමා ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පෙර පාසලක් අසලින් ගොඩනැගිල්ලක් මිලදී ගෙන ආරම්භ කරන ලදී.

මෙම සිද්ධියේ සඳහන් "දිලූ ටෙක්ස්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද ?

1 ආහාර 2 ඇඳුම් 3 නිවාස 4 ආරක්ෂාව

(02) "දිලූ ටෙක්ස්" ව්‍යපාරය විසින් මිල දී ගත් ගොඩනැගිල්ල අයත් වන නිෂ්පාදන සාධකය කුමක්ද ?

1 භූමිය 2 ශ්‍රමය 3 ප්‍රාග්ධනය 4 ව්‍යවසායකත්වය

(03) (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද ?

(ආ) ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් ලියන්න.

(04) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න දක්වන්න.

(අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යෙන්ම සපුරා ගත යුතු දෑ මිනිස් අවශ්‍යතා වේ. (..................)

(ආ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර පොදු හා පෞද්ගලික ලෙස වර්ග කෙරේ. (...................)

(ඉ) නිෂ්පාදනයේදී භාවිතා කරන, මිනිසා විසින් සකස් කර ඇති දෑ නිෂ්පාදන සාධකයක් වන ශ්‍රමය වේ. (...................)

(05) සුනිමල් පදම් කළ හම් භාවිතයෙන් සපත්තු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) සුනිමල්ගේ ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද ?

(ආ) සපත්තු නිෂ්පාදනය සඳහා භාවිතා කරන පදම් කළ හම් ඉහත ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(06) (අ) මිනිස් අවශ්‍යතාවක් යනු කුමක්ද ?

(ආ) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ දෙකක් ලියන්න.

(07) පහත සඳහන් ප්‍රකාශ **සත්‍යද අසත්‍යද** යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය තුළින් විවිධ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන සේවකයෝ එම ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් වේ. (.........................)

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර භාවිතා කරන ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. (.........................)

(ඊ) නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සපයන ව්‍යාපාර ලෙස වර්ග කළ හැකිය. (.........................)

(08) අමා සහ රසාංගා ඇඹිලිපිටියේ පදිංචි පසිඳුගෙන් නැවුම් කිරි මිලට ගෙන, මීකිරි නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'අමරස මීකිරි' නමින් පවත්වා ගෙන යයි.

(අ) මෙම සිද්ධියේ සඳහන් වන අමරස මීකිරි ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් වුවමනාව කුමක්ද ?

(ආ) මෙම සිද්ධියේ සඳහන් පසිඳුගේ ව්‍යාපාර සංවිධාන වර්ගයට සාපේක්ෂව අමරස මීකිරි නිෂ්පාදන ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් සඳහන් කරන්න.